---

**ඇල්පිටිය ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 10 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 31 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගම නැගුම ව්‍යාපෘති යටතේ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.17,103,617 ක මූලධන ආධාර මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ආ) සංවර්ධන ව්‍යාපෘති 16 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.3,518,091 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල රු.2,388,119 ක් පමණක් ප්‍රතිපාදන සලසා තිබීමෙන් ප්‍රාග්ධන වියදම් හා ණයහිමියන් රු.1,129,972 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුව තිබුණු රු.6,724,372 ක් වූ දායක මුදල් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 18 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු.5,804,981 ක් විය.

**(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.63,495,363 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,432,236 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,038,427 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 3,691 | 3,849 | 5,704 |
| (ii) | බදු කුලී | 1,833 | 2,131 | 319 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,201 | 854 | - |
| (iv) | වෙනත් ආදායම් | 30,939 | 33,356 | 13,445 |

### 2.2.2 වෙළඳ බලපත්‍ර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාර ව්‍යාපාර ආයතන 139 කින් 2012 වසර සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු ලබා නොගැනීම නිසා රු.96,950 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 680,917 |
| (ii) | මුද්දර ගාස්තු | 11,912,166 |

### 2.2.4 කඩ කාමර බදු දීම.

සභාවට අයත් කඩ කාමර 56 ක් බදුදීම පිළිබඳව 2013 මාර්තු 22 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී පළාත් පාලන කොමසාරිස් විසින් 2010 දෙසැම්බර් 27 දින නිකුත් කර තිබූ අංක: දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කර නොතිබූ බව අනාවරණය විය.

(අ) කඩ කාමර 56 හිම ගිවිසුම් වසර 03 කට වඩා පැරණි ගිවිසුම් විය.

(ආ) කඩ කාමර සියල්ලගෙන් ම වසර 5 කට වඩා පැරණි තක්සේරු මුදලකට අනුව තීරණය කල බදු මුදලක් අය කර තිබුණි.

(ඇ) පොදු වෙළඳපොල කඩ කාමර 06 ක් අතුරු බදු දී තිබුණු අතර, සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක් විකුණා තිබුණි.

(ඈ) කඩ කාමර 06 ක වෙනස්කම් කර තිබුණි.

(ඉ) කඩ කාමර 06 ක් ඉදිරියේ භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා රුස්කර තිබුණි.

### 2.2.5 දුරකථන/විදුලි සංදේශ කුළුණු ගාස්තු

නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2008 දෙසැම්බර් 16 දිනැති අංක:5/02/1/384 දරන චක්‍රලේඛයේ 7(v) වගන්තියට අනුව සෑම කුළුණක් සඳහාම අනුකූලතා සහතිකයක් ලබා ගතයුතු අතර, එසේ ලබාගෙන නොමැති නම් එම චක්‍රලේඛයේ 7(vii) වගන්තියට අනුව අනුකූලතා සහතික නොමැතිව භාවිතා කිරීම මත අනුමත කර වසරක් ඉක්ම වූ දින සිට සභාවෙන් සංශෝධනයක් කර නොමැති නම් එක් දිනකට රු.50 බැගින් දඩ අයකළ යුතු බව දක්වා තිබුණ ද, 2013 මාර්තු 25 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවන්හි දී සභා බලප්‍රදේශයේ ඉදිකර, භාවිතයට ගන්නා කුළුණු 03 ක් සඳහා අනුකූලතා ගාස්තු රු.18,000 ක් සහ රු.54,000 ක දඩ මුදලක් අයකර නොතිබුණි.

### 2.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

2012 මැයි 08 දින සභාව විසින් මිලදී ගෙන තිබුණු රු.1,444,500 ක් වටිනා ළමා ක්‍රීඩා උපකරණ කට්ටල 03 ක් ඇල්පිටිය ළමා ක්‍රීඩාංගනයේ සවි කිරීමට කටයුතු නොකර, 2013 අගෝස්තු 29 විගණන දින වනවිටත් සභා භූමියේ වූ ගොඩනැගිල්ලක තබා තිබුණි. මේ සඳහා විගණන දිනට රු.1,083,375 ක මුදලක් ගෙවීම් කර තිබුණි.

------------------------------------------------------------------------------------------------------------------------------------------------------

## 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ දකුණු පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් වැඩ යෝජනා 20 ක් සඳහා සභාව වෙත ලබා දී තිබූ රු.1,715,335 ක් විගණන දිනය වූ 2013 අගෝස්තු 29 දින දක්වා අදාළ කාර්යයන්ට යොදා නොගෙන නිශ්ක්‍රීයව සහා අරමුදලේ රඳවාගෙන තිබුණි.

(ආ) මන්ත්‍රීවරුන් 15 දෙනාම 2011 සහ 2012 යන වර්ෂයන් සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබු අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි.

(ඈ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 2.5 වීථි පහන් නඩත්තුව

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) බලප්‍රදේශයේ නඩත්තු කරන වීථි පහන් වෙන් වෙන්ව හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. වීථි පහන් නඩත්තුව සඳහා උපාංග නිකුත් කිරිමේ දී අදාල නිශ්චිත විදුලි පහන් හඳුනා ගැනීම තුළින් එය සිදු නොකරන බැවින් ඒ ඒ වීථි පහන් සඳහා සවි කරන ලද උපාංගවල කල් පැවැත්ම සලකා බැලීමේ ක්‍රමයක් සභාව විසින් හඳුනාගෙන නොතිබුණි.

(ආ) 2008 මාර්තු 14 න් පසු විදුලිබල මණ්ඩලය සමග ගිවිසුම් අත්සන් කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය තුළ වීථි පහන් නඩත්තුව සඳහා දරන ලද රු.515,550 ක සම්පූර්ණ මුදලම සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

---

## 2.6 ඉඩම් වෙන්දේසි

### (අ) ඉදිපලේගොඩ ඉඩම

සභා බලප්‍රදේශය තුල පිහිටි ඉදිපලේගොඩ අක්කර 9 පර්චස් 12.9 ක ඉඩම පිඹුරුපත් අංක 373/2011 මගින් කැබලි 94 කට බෙදා වෙන්කර සභාව විසින් සංවර්ධන බලපත්‍රය දින රහිතව අනුමත කර තිබුණි. 2013 මාර්තු 25 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම ඉඩම අනුමත කිරීමේ දී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් 2012 මැයි 03 නිකුත් කරන ලද ලිපියේ නිර්දේශයන් ක්‍රියාත්මක කළයුතුව තිබුණ ද, එම නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

* මෙම ඉඩම තුල ඇති පිවිසුම් මාර්ග භාවිතා කලහැකි ආකාරයට සංවර්ධනය කලයුතු වුවත්, සැලැස්මේ දකුණු දිශාවේ ඇති කැබලි අංක 91 ට යාබදව පවතින අඩි 20 ක පළල පාරේ පස් සෝදා ගොස් පාශාන තට්ටු මතු වී භාවිතා කළ නොහැකි ආකාරයට පාර මැද ජලය බැස යන කාණු සෑදී තිබුණි.

* පිවිසුම් මාර්ගවලට සමගාමීව කාණු පද්ධතියක් ඉඩමේ ඇති කලයුතු අතර, වර්ෂා කාලයේ දී බිම් කොටස්වල ජලය එම කාණු මගින් පහලට ගලා යා හැකි වියයුතුය යන්න දක්වා තිබුණ ද, ප්‍රධාන මාර්ගයට ආසන්නයේ හැර ඉඩමේ ඉහල කොටසේ කාණු සකසා තිබුණ ද, කොන්ක්‍රීට් නොකිරීම නිසා කාණු විනාශ වී තිබුණි.

(ii) සභාවට ලබා දී ඇති කැබලි අංක 89 න් පෙන්වා ඇති පර්චස් 15 ක ඉඩම් කොටස් අක්කර 9 පර්චස් 12.9 ක ඉඩමේ නිරිතදිග කෙලවර පවතින ඉඩම් කැබැල්ලක් බැවින් පොදු කටයුතු සඳහා යොදා ගතහැකි ආකාරයේ සුදුසු ඉඩම් කැබැල්ලක් නොවන බවත් ඉඩමේ පහත්ම බිම් කොටසක් බවත් නිරීක්ෂණය විය.

**(ආ) සිනමන් පාක් ඉඩම**

සභා බලප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරියට අයත් සීමාවේ අක්කර 4 යි පර්චස් 32 කින් යුතු සිනමන් පාක් නමින් වෙන්දේසි කරන ලද ඉඩම පිඹුරුපත් අංක 1555 මගින් කැබලි 47 කට බෙදා වෙන්කර සභාව විසින් 2012 මාර්තු 13 දින සංවර්ධන බලපත්‍රය අනුමත කර තිබුණි. මේ පිළිබඳ 2013 මාර්තු 25 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති විසින් 1991 සැප්තැම්බර් 30 දින නිකුත් කරන ලද අංක: 1/5/01/10(ii) දරන චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි ඉඩම් වෙන්දේසි කිරීමේ දී හෙක්ටයාර් 1 කට වැඩි නම් වීථි අත්හැරීමෙන් පසු මුළු ඉඩමේ ප්‍රමාණයෙන් 10% ක් සභාවට ප්‍රජා හා විනෝද කටයුතු සඳහා යොදාගත හැකි වන ලෙස සුදුසු ස්ථානයකින් ලබා දියයුතු වුවත්, මෙම ඉඩමේ වීථි අත්හැරීමෙන් පසු ඉඩම් ප්‍රමාණය වූ පර්චස් 582.87 කින් 10% ක් වූ පර්චස් 58.28 ක් පොදු කටයුතු සඳහා ලබා ගතයුතු වුවද, සභාවට ලබා දී තිබුණේ පර්චස් 52.70 කි. මේ අනුව පර්චස් 5.58 ක් අඩුවෙන් සභාවට ලබා දී තිබුණි.

## 2.7 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ද සිදුකර නොතිබූ අතර 2006 අගෝස්තු 28 දිනැති හා අංක : PE/F/S/4(xiii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය